## ඌව පළාත් සභා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහය - සංශෝධන අංක 01

| ඡේද අංකය | දැනට තිබෙන පෙළ | ඡේද අංකය | යෝජිත සංශෝධන | සංශෝධනයට හේතු |
|---|---|---|---|---|
| 10.3.2.1 | අධ්‍යාපන සුදුසුකම්<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් එක් වරකදී භාෂාව /සාහිත්‍ය හා අංක ගණිතය/ ශුද්ධ ගණිතය /මූලික ගණිතය/ වාණිජ අංක ගණිතය ඇතුළුව විෂයන් හය (06) කට නොඅඩුව සම්මාන සාමාර්ථ දෙකක් සහිතව සමත් වී තිබිය යුතුය. | 10.3.2.1 | අධ්‍යාපන සුදුසුකම්<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය/ අංක ගණිතය/ශුද්ධ ගණිතය/මූලික ගණිතය/වාණිජ අංක ගණිතය ඇතුළුව විෂයන් හයකින් (06) සමත්ව තිබීම. | රාජ්‍ය කළමණාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ සිදුකරන ලද 02 වන සංශෝධනය අනුව ඌව පළාත් සභා රාජ්‍ය කළමණාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා |
| 10.3.2.3 | පළපුරුද්ද<br><br>නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. | 10.3.2.3 | පළපුරුද්ද<br><br>නියමිත දිනට ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර, ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.<br><br>(මෙ යටතේ වූ පැහැදිලි කිරීම එලෙසම පවතිනු ඇත) | රාජ්‍ය කළමණාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ සිදුකරන ලද 01 වන සංශෝධනය අනුව ඌව පළාත් සභා රාජ්‍ය කළමණාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා |
| 10.3.2.5<br><br>iv | වෙනත්<br><br>පෙළක් නොමැත. | 10.3.2.5<br><br>iv | වෙනත්<br><br>නියමිත දිනට පූර්වාසන්න වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය. | රාජ්‍ය කළමණාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ සිදුකරන ලද 01 වන සංශෝධනය අනුව ඌව පළාත් සභා රාජ්‍ය කළමණාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා |

| | | | | |
|---|---|---|---|---|
| 13.3.1.1 (ආ) III | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිය සමත්, සේවයේ II ශ්‍රේණියේ නිලධරයෙකු වීම. | 13.3.1.1 (ආ) III | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිය සමත්,සේවයේ වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරියෙකු වීම. | රාජ්‍ය කළමණාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ සිදුකරන ලද 01 වන සංශෝධනය අනුව ඌව පළාත් සභා රාජ්‍ය කළමණාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා |
| 13.3.1.2 | උසස් කිරීමේ ක්‍රමය<br><br>අධි ශ්‍රේණියේ පුරප්පාඩු වලින් 35% කට නොවැඩි ප්‍රමාණයකට පත් කිරීම කරනු ලබන්නේ සීමිත තරඟ විභාගයක ප්‍රතිඵල මතය.සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව පත් කරනු ලැබේ.සම්මුඛ පරීක්ෂණය අයදුම් කරුවන්ගේ සුදුසුකම් සනාථ කෙරෙන සහතික පරීක්ෂා කිරීම සඳහා පමණක් වන අතර එහිදී ලකුණු දීමක් සිදු නොවේ.(විෂය නිර්දේශය හා ලකුණු ලබා දීමේ පටිපාටිය 09 ඇමුණුමේ දැක්වේ) | 13.3.1.2 | උසස් කිරීමේ ක්‍රමය<br><br>අධි ශ්‍රේණියේ පුරප්පාඩු වලින් 50% කට  අදාල පත්කිරීම් කරනු ලබන්නේ සීමිත තරඟ විභාගයක ප්‍රතිඵල මතය.සීමිත තරඟ විභාගය සමත්වීම සඳහා විභාගයට අදාල එක් එක් විෂයයන්ට අවම වශයෙන් ලකුණු 40ක් ලබා ගත යුතුය. සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව පත් කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය අයදුම්කරුවන්ගේ සුදුසුකම් සනාථ කෙරෙන සහතික පරීක්ෂා කිරීම සඳහා පමණක් වන අතර එහිදී ලකුණු දීමක් සිදු නොවේ.(විෂය නිර්දේශය හා ලකුණු ලබා දීමේ පටිපාටිය 09 ඇමුණුමේ දැක්වේ.) | රාජ්‍ය කළමණාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ සිදුකරන ලද 01 වන සංශෝධනය අනුව ඌව පළාත් සභා රාජ්‍ය කළමණාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා |
| 13.3.2.2 | උසස් කිරීමේ ක්‍රමය<br><br>අධි ශ්‍රේණියේ පුරප්පාඩු වලින් 65% ක් කුසලතා මත උසස් කිරීම මගින් පුරවනු ලැබේ.මේ සඳහා ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අභියෝගාතා පරීක්ෂණයක ප්‍රතිඵල මත හා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් ජ්‍යෙෂ්ඨතාව හා පලපුරුද්ද පදනම් කරගෙන දෙනු ලබන ලකුණු වල එකතුවේ අනුපිළිවෙල අනුව ප්‍රමුඛත්වය තීරණය කරනු ලැබේ.කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන | 13.3.2.2 | උසස් කිරීමේ ක්‍රමය<br><br>අධි ශ්‍රේණියේ පුරප්පාඩු වලින් 50% ක ප්‍රමාණයකට අදාල පත්කිරීම් කුසලතා පදනම මත සිදු කරනු ලැබේ. මේ සඳහා ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අභියෝගාතා පරීක්ෂණයකට මුහුණ දී එක් එක් විෂයයන්ට අවම වශයෙන් ලකුණු 40ක් ලබා සමත් විය යුතුය. එහි ප්‍රතිඵල මත හා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් ජ්‍යෙෂ්ඨතාව හා පලපුරුද්ද පදනම් කරගෙන දෙනු ලබන ලකුණු වල එකතුවේ අනුපිළිවෙල අනුව ප්‍රමුඛත්වය තීරණය කරනු | රාජ්‍ය කළමණාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ සිදුකරන ලද 01 වන සංශෝධනය අනුව ඌව පළාත් සභා රාජ්‍ය කළමණාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා |

| | | | | |
|---|---|---|---|---|
| | මණ්ඩලයක් ඉදිරියේ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකට අයදුම්කරුවන් පෙනී සිටිය යුතුය. එම සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දෙනු නොලැබේ.(ඇමුණුම 10) | | ලැබේ. කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන මණ්ඩලයක් ඉදිරියේ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකට අයදුම්කරුවන් පෙනී සිටිය යුතුය. එම සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දෙනු නොලැබේ. (ඇමුණුම 10) | |
| ඇමුණුම 04 | සටහන : ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන පරිගණක මෙහෙයුම් ප්‍රායෝගික බලපත්‍රය ලබා ඇති නිලධරයෝද, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන පරිගණක උපාධිය ලබා ඇති නිලධරයෝද, තෘතීය අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආයතනයක NVQ 4 මට්ටම හෝ ඉන් ඉහළ මට්ටමක ප්‍රවීණතාවය ලද නිලධරයෝ ද ඉහත පරිගණක පරීක්ෂණයෙන් නිදහස් කරනු ලබති. | ඇමුණුම 04 | **සටහන 01**<br>රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉමට අදාල පරිගණක පරීක්ෂණයෙන් පහත අවශ්‍යතා සපුරා ඇති නිලධාරීන් නිදහස් කරනු ලැබේ.<br>01.පහත ආයතනවලින් ලබා දෙන සේවා ව්‍යවස්ථාවේ දැක්වෙන පරිගණක පාඨමාලාවේ විෂය නිර්දේශයට සමාන විෂය නිර්දේශයක් යටතේ ඇති පරිගණක පාඨමාලා හදාරා ඇති නිලධාරීන්<br>a. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA)<br>b.ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය<br>c. වෘත්තීය පුහුණු අධිකාරිය<br>d.කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ ඇති කාර්මික විද්‍යාල හා තාක්ෂණ විද්‍යාල මගින් පවත්වනු ලබන පාඨමාලා<br>e.විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් විසින් පිළිගනු ලබන විශ්ව විද්‍යාල හෝ වෙනත් ආයතන<br>f. ජාතික තරුණ සේවා සභාව<br>02. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියාපදිංචි පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යා උපාධිය හෝ උපාධිය සඳහා පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති නිලධාරීන්<br>**සටහන 02**<br>මෙම සංශෝධන ගැසට් පත්‍රය ප්‍රකාශයට පත්කරන දින සිට වසර 02 කාලයක් දක්වා, අංක 1840/34 හා 2013.12.11 දිනැති ඌව පළාත් සභා රාජ්‍ය කළමණාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ ඇමුණුම 04 හි සටහනේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන නිලධාරීන්ද පරිගණක පරීක්ෂණයෙන් නිදහස් කරනු ලබති. | රාජ්‍ය කළමණාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ සිදුකරන ලද 01 වන සංශෝධනය අනුව ඌව පළාත් සභා රාජ්‍ය කළමණාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධනය කිරිම සඳහා |

| | | | | |
|---|---|---|---|---|
| ඇමුණුම 06 | 02. විභාගය පිළිබඳ විස්තරය (I වන ශ්‍රේණියට උසස් වී වසර පහක් ඇතුලත සමත්විය යුතුය.)<br><br>04. විභාගය පවත්වනු ලබන කාල සීමාව : සෑම වර්ෂයකම දෙවරක් පවත්වනු ලැබේ.<br><br>05. විභාගය සඳහා වන විෂය නිර්දේශය : | ඇමුණුම 06 | 02. <u>කාර්යක්ෂමතා කඩඉම් විභාගය</u> පිළිබඳ විස්තරය (I වන ශ්‍රේණියට උසස් වී වසර පහක් ඇතුලත සමත්විය යුතුය.)<br><br>04. <u>කාර්යක්ෂමතා කඩඉම් විභාගය</u> පවත්වනු ලබන කාල සීමාව : සෑම වර්ෂයකම දෙවරක් පවත්වනු ලැබේ.<br><br>05. <u>කාර්යක්ෂමතා කඩඉම් විභාගය</u> සඳහා වන විෂය නිර්දේශය : | රාජ්‍ය කළමණාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවට සිදුකරන ලද 02 වන සංශෝධනය අනුව ඇමුණුම 6 හි 2,4 හා 5 අංක වල සඳහන් විභාගය යන්න වෙනුවට කාර්යක්ෂමතා කඩඉම් විභාගය යන්න ආදේශ කිරීම. |
| ඇමුණුම 06<br>අංක 06 | පෙළක් නොමැත. | ඇමුණුම 06<br>අංක 06 | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I ශ්‍රේණියේ නිලධාරින් සඳහා රාජ්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු දැනුවත් වී සිටිය යුතු මූලික සිද්ධාන්ත අඩංගු දින 10 කින් යුත් පහත පාඨමාලාව <u>I ශ්‍රේණියට උසස් වී වසර 05 ක් ඇතුළත</u> සාර්ථකව හදාරා නිම කිරීම මත I ශ්‍රේණියේ නිලධාරීන්ට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාග අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.<br><br>i. පාඨමාලාව පවත්වන බලධරයා : ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් හෝ ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් බලය පවරන ලද ආයතනයක් විසින් පවත්වනු ලැබේ.<br><br>ii. පාඨමාලාව පවත්වනු ලබන කාලසීමාව: I ශ්‍රේණියට නියමිත පුහුණු පාඨමාලාවට අදාළව ඉල්ලුම්පත් කැඳවීම සඳහා වූ නිවේදනය සෑම වර්ෂයකම මුල් කාර්තුවේ දී ප්‍රසිද්ධියට පත් කරනු ලබන අතර, ඒ සඳහා ලැබෙන ඉල්ලුම් පත් ප්‍රමාණය සලකා බැලීමෙන් අනතුරුව වර්ෂයකට පවත්වන වාර ගණන තීරණය කරනු ලබයි. | රාජ්‍ය කළමණාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ සිදුකරන ලද 02 වන සංශෝධනය අනුව ඌව පළාත් සභා රාජ්‍ය කළමණාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධනය කිරිම සඳහා |

| | | | | |
|---|---|---|---|---|
| | | | iii. පාඨමාලාවේ විෂය නිර්දේශය<br><br>සටහන :<br>01.ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන පරිදි ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ හෝ ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය මත රාජ්‍ය සේවා පුහුණු ආයතනය /ඌව පළාත් කළමනාකරණ සංවර්ධන පුහුණු ආයතනය මගින් පවත්වනු ලබන ඉහත සඳහන් පාඨමාලාවේ මොඩියුල පහම සාර්ථකව සම්පූර්ණ කිරීම මගින් පමණක් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් නිදහස් කරනු ලැබේ.<br><br>02. තවද, ඌව පළාත් සභා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කිරීම සඳහා ඉහත (01) කොටසින් දක්වා ඇති විභාගය සමත් වීම හෝ (06) කොටස මගින් දක්වා ඇති පාඨමාලාවේ විෂය නිර්දේශය යටතේ ඇති මොඩියුල 05 ම සාර්ථකව සම්පූර්ණ කිරීම හැර විභාගයේ විෂයයන් හා පාඨමාලාවේ විෂයයන් ඒකාබද්ධ වූ විෂයෙන් විෂයට නිදහස් කිරීමේ පදනමක් මත කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කිරීමක් කිසිසේත් සිදු කරනු නොලැබේ. | |

iii. පාඨමාලාවේ විෂය නිර්දේශය

| මොඩියුලය | කාලය |
|---|---|
| රාජ්‍ය සේවයේ විනය ක්‍රියා පටිපාටිය | දින 02 |
| රාජ්‍ය මූල්‍ය කළමනාකරණය හා වත්කම් කළමනාකරණය | දින 03 |
| සංවිධාන ඵලදායීත්වය | දින 02 |
| ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය | දින 02 |
| තොරතුරු දැනගැනීමේ පනත හා පාරිභෝගික සත්කාරය | දින 01 |

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ / අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන

දිනය : 2019.05.08

ආර්.එම්.එස්.ඩී. රත්නායක
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) කාර්යාලය
ඌව පළාත් සභාව,
බදුල්ල

ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ අත්සන

දිනය : 2019.05.08

පී.බී. විජයරත්න
ඌව පළාතේ ප්‍රධාන ලේකම්
ඌව පළාත් සභාව,
බදුල්ල

ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය:- නිර්දේශ කරමු

1. නීතිඥ මොහාන් ආර්.ඒ.රත්වත්තේ මහතා (සභාපති) ----------------------------------------
2. ආර්.ඥානසේකරන් මහතා (සාමාජික) ----------------------------------------
3. නීතිඥ ධනුෂ්ක වැලිගම මහතා (සාමාජික) ----------------------------------------
4. නීතිඥ එම්.එම්.විජිත පීරිස් මහතා (සාමාජික) ----------------------------------------
5. ආර්.එම්.ගුණවර්ධන මහතා (සාමාජික) ----------------------------------------
6. එම්.එස්.එම්.ෆාරුක් මහතා (සාමාජික) ----------------------------------------
7. නීතිඥ ඩබ්.එම්.සෙනෙවිරත්න මහතා (සාමාජික) ----------------------------------------

දිනය

2019/6/4

ආණ්ඩුකාරවර ලේකම්,

2019/06/04 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 40 යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ඌව පළාත් සභා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සංශෝධන අංක 01 ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය 2019.06.12

----------------------------------------

ලේකම්

ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ගාමිණී මහින්දපාල ජෝපියස්
ලේකම්
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය : අනුමත කරමි/~~නොකරමි~~

දිනය 2019/09/20

----------------------------------------

ඌව පළාත් ආණ්ඩුකාරවර

ජනාධිපති නීතිඥ මෛත්‍රී ගුණරත්න
ඌව පළාත් ආණ්ඩුකාරවර
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය
ටප් වීදිය, බදුල්ල